ඔබ අතරින් කිසිවෙකු හෝ තම පවුල වෙත නැවත හැරී යන විට එහි පුෂ්ටිමත් විශාල ගැබ්බර ඔටු දෙනුන් තිදෙනෙකු ලබන්නට කැමති වන්නේ ද?

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "ඔබ අතරින් කිසිවෙකු හෝ තම පවුල වෙත නැවත හැරී යන විට එහි පුෂ්ටිමත් විශාල ගැබ්බර ඔටු දෙනුන් තිදෙනෙකු ලබන්නට කැමති වන්නේ ද? යැයි විමසූහ. අපි: "ඔව්" යැයි පැවසුවෙමු. එතුමාණෝ: "ඔබ අතරින් කිසිවෙකු හෝ තම සලාතයේ දී ආයාත් තුනක් පාරායනය කිරීම එවන් පුෂ්ටිමත් විශාල ගැබ්බර ඔටු දෙනුන් තිදෙනෙකුට වඩා උතුම් යැ"යි පවසා සිටියහ.
[صحيح] [رواه مسلم]

සලාතයේ දී අල් කුර්ආන් පාඨ තුනක් පාරායනය කිරීමේ ප්රතිඵලය ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලමම්) තුමාණන් පැහැදිලි කර සිටියි. එය මිනිසා තම නිවසෙහි පුෂ්ටිමත් දැවැන්ත ගැබ්බර ඔටු දෙනුන් තිදෙනෙකු ලැබීමට වඩා උතුම්ය.

https://sunnah.global/hadeeth/si/show/65053